



ඇන් ෆ්‍රෑන්ක්ගේ දිනපොත, අද

ඇන් ෆ්‍රෑන්ක්
'මා වැනි කෙනෙකුට දිනපොතක ලිවීම අමුතුම අත්දැකීමකි. මක් නිසාද යත් මා මීට පෙර කිසි දෙයක් ලියා නැති නිසා පමණක් නොව, දහතුන් හැවිරිදි පාසැල් දැරියකගේ කතාවක් පිළිබඳ කාව්‍යයක් කියවීමට මම හෝ වෙනත් කිසිවකු උනන්දුවක් නොදක්වන හෙයිනි.'

දහතුන් වෙනි උපන් දිනයේදී ඇන් ෆ්‍රෑන්ක්ට දිනපොතක් ලැබේ. ඉන් සති කිහිපයකට පසු ඇගේ ජීවිතය කණපිට පෙරළේ. අනතුරුව අවුරුදු දෙකක් පුරාවටම ඇය සිය හැඟීම්, සිතුවිලි සහ අත්දැකීම් සිය දිනපොතට නඟයි. මේ දිනපොත ලොව පුරා ලක්‍ෂ සංඛ්‍යාත ජනතාව කියවනු ඇතැයි ඇය කිසි විටක දැන සිටියේ නැත.




'මා උපන්නේ 1929 ජූනි 12වනදායි'

ඇන් ෆ්‍රෑන්ක්*
'මා දුටු වඩාත්ම උත්කෘෂ්ටම පියා වූ මගේ පියා තමාට අවුරුදු තිස් හයක්ද, මවට අවුරුදු විසි පහක්ද වන තෙක් ඇය හා විවාහ වූයේ නැත. මගේ සොයුරිය මාගෝ, ජර්මනියේ ප්‍රධාන නගරයක් වූ ෆ්‍රෑන්ක්ෆර්ට්හි 1926දී උපත ලැබුවාය. මම 1929 ජූනි 12වන දින උපත ලැබීමි.'

ඇන් ෆ්‍රෑන්ක්, ඔටෝ ෆ්‍රෑන්ක් සහ එඩිත් ෆ්‍රෑන්ක් හොලන්ඩර්ගේ දෙවන දියණියයි. ෆ්‍රෑන්ක් සහ හොලන්ඩර් පවුල් පරම්පරා ගණනාවක් තිස්සේ ජර්මනියේ ජීවත් වූහ. ෆ්‍රෑන්ක් පවුල ස්වාධීන යුදෙව් ජාතිකයෝය. ඔවුන් යුදෙව් දහම හා බැඳීමකින් යුක්ත වුවද දැඩි අනුගාමිකයෝ නොවූහ. 1930 සිටි ජර්මානු ජනගහණයෙන් 1% ක් පමණ එනම් මිලියන භාගයක් පමණ යුදෙව් ජාතිකයෝ වූහ.

1 ඇන්ගේ දෙමාපියන්ගේ විවාහ මංගල්‍යය, 1925 මැයි 12.
2 ජර්මානු නිලධාරීන් වූ, ඇන්ගේ පියා (වම) සහ ඇගේ බාප්පා වූ රොබට් පළමු ලෝක යුද්ධ කාලයේදී (1914 * 1918).
3 හෙදියක වූ ඇන්ගේ මිත්තණිය වූ ෆ්‍රෑන්ක් පළමු ලෝක යුද්ධ කාලයේ, හමුදා රෝහලකදී.




## ජර්මන් අර්බුදය

1918 ජර්මනිය පරාජයට පත්වීමත් සමඟ පළමු ලෝක යුද්ධය සමාප්තියට පත් වේ. වර්සේලිස් සම්මුතියට යුද්ධය අවසානයේදී අත්සන් තබන අතර එයින් ජර්මනියට දැඩි වන්දි පනවයි. දස ලක්ෂ ගණනකට රැකියා අහිමිව අන්ත දිළිඳු භාවයට තල්ලු කර දමන ලදී. උද්ධමනය පාලනය කළ නොහැකි තත්ත්වයට පත් වේ. 1923 වන විට මුදලේ වටිනාකමක් නොමැති තරම්ය. බොහෝ ජර්මානුවන් කෝපාවිෂ්ඨව සිටිති. 1929දී ලෝකයම විශාල ආර්ථික අර්බුදයකට පත් වන අතර විශේෂයෙන් ජර්මනියට දැඩි ලෙස පහර වැදේ. ඇඩොල්ෆ් හිට්ලර්ගේ නායකත්වයෙන් යුත් අන්තවාදී කුඩා දේශපාලන පක්ෂයක් වන NSDAP (National Socialist German Workers Party) පක්ෂය, ජර්මනියේ සහ ලෝකයේ ගැටළු සියල්ල වෙනුවෙන් යුදෙව්වන්ට දෝෂාරෝපණය කරයි. විරැකියාවත් දුප්පත්කමත් නිසා ඇතිවූ ප්‍රශ්නවලට තමා සතුව විසඳුම් ඇති බවද හිට්ලර් කියයි.

1 1932 බර්ලිනයේ රිෂ්ටාග් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ වර්සේල්ස් සම්මුතියට එරෙහිව පෙළපාලියක්.
2 දිළිඳු බවෙන් පෙළෙන දරුවන් සඳහා මුදල් එකතු කරයි, 1920.
3 නොවටිනා බැංකු නෝට්ටු ගොඩක් සමඟ සෙල්ලම් කරන ළමයින්, 1923
4 නර්ම්බර්ග්හි වාර්ෂික රැළියකට සහභාගී වන හිට්ලර්, 1927. ජර්මනියේ ප්‍රශ්නවලට හේතුව යුදෙව්වන් බව ඔහු නැවත නැවත කියයි.
5 හිට්ලර් පහත පරිදි ජනතාව ආකර්ෂණය කර ගනියි. 1930දී, ජර්මානුවන්ගෙන් 18.3%ක් නාසි පක්ෂයට (හිංඡ) ඡන්දය දෙයි.




## 'මට අවුරුදු හතරක් වන තෙක් අපි ෆ්‍රෑන්ක්ෆ'ර්ට්හි වාසය කළෙමු'

දුඹුරු කමිස
'1932 මුල් කාලයේ දී ස්ටෝම් හමුදා (දුඹුරු කමිස) පහත ගී ගයමින් පැමිණියහ'. යුදෙව්වන්ගේ ලේ පිහියෙන් ගලා යන විට'... මම මෙය වහාම මගේ බිරිඳ සමඟ සාකච්ඡා කළෙමි. අපි මෙහෙ ඉන්නේ කොහොමද?' (ඔටෝෆ්‍රෑන්ක්)

ඔටෝ සහ එඩිත් සිය අනාගතය ගැන බොහෝ බියකින් පසුවෙති. නාසිහු බලයෙන්ද ම්ලේච්ඡත්වයෙන්ද වර්ධනය වෙමින් සිටිති. ඔටෝ වැඩ කරන බැංකුවේද සිදුවන දේ තවත් නරක අතට පත් වෙමින් ඇත. ආර්ථික අර්බුදයක් ඇති වීමට තවත් දේ අවශ්‍ය වන්නේ නැත. ඔටෝ සහ ඊඩිත්ට පලා යාමට අවශ්‍ය විය. නව ජීවිතයක් ආරම්භ කළ හැකි වෙනත් රටක් වේදැයි ඔවුහු කල්පනා කරති. දෙමාපියන්ගේ කණසල්ල ගැන මාගෝට සහ ඇන්ට කිසිවක් නොවැටහේ.

1 ඇන්, මාගෝ සහ පියා, 1931.
2 1933 ඔක්තෝබර් මස ඇන් සහ මාගෝ සිය ආච්චි වූ හොලන්ඩර් සමඟ ලන්දේසි දේශ සීමාව ආසන්නයේ ආචන්හි (ජර්මනියේ) සිටියහ.
3 ඇන්, ජූලි 1933.
4 මාගෝ ෆ්‍රෑන්ක් 1929 දී. සිය සොයුරිය වූ ඇන් උපදින විට ඇගේ වයස අවුරුදු තුනකි.



## හිට්ලර් මැතිවරණය ජයග්‍රහණය කරයි

1932 වන විට ජර්මානුවන් මිලයන 6ක් විරැකියාවෙන් පෙළෙති. ජර්මානුවන් වැඩි වැඩියෙන් අන්තවාදී සහ ප්‍රජාතාන්ත්‍ර විරෝධී පක්ෂවලට ආකර්ෂණය වෙති. කොමියුනිස්ට්වාදීන් සහ ජාතික සමාජවාදීන් යන දෙපිරිසම සමාජයේ සියලු ප්‍රශ්වලට ඇති එකම විසඳුම තමන් සතු බව කියා සිටිති. දේශපාලන වෙනස්කම් බොහෝ විට වීදි සටන් බවට පත් වෙයි. NSDAP පක්ෂය මෙම භීෂණය තම වාසියට හරවා ගනියි. 1932 නොවැම්බර් වන විට 33.1%ක ඡන්ද ජයග්‍රහණය කරන ඔවුහු පාර්ලිමේන්තුවේ විශාලතම පක්ෂය බවට පත් වේ.

1 හිට්ලර් - අපේ අවසන් බලාපොරොත්තුව භීෂ් පක්ෂ මැතිවරණ පෝස්ටරය, 1932.

2 1932 වර්ෂයේ බර්ලිනයේ දිළිඳු ප්‍රදේශයක්. කොමියුනිස්ට් සහ ජාතික සමාජවාදීන් එකම වීදියේ වාසය කරති. තාප්පවල මෙසේ ලියා ඇත. 'අපේ දරුවන් මෙතැන නාස්ති වෙමින් සිටිති'.

3 මෙම 1932 ඡායාරූපෙයේ හිට්ලර්ව අනුගාමිකයින් වට කර ගෙන සිටිති.

4 1932 වන විටද නාසින්ට බොහෝ විරුද්ධවාදීන් සිටිති. මේ NSDAP පක්ෂ විරෝධී පෙළපාලියකි.

5 හැනොවර්හි සේවා නියුක්ති කාර්යාලය අසළ පෙළ ගැසී සිටින විරැකියාවෙන් පෙළෙන ජනතාව. වැටේ ලියා ඇත්තේ 'හිට්ලර්ට ඡන්දය දෙන්න' යනුවෙනි.




'මා වටා ලෝකය බිඳ වැටුණි'

:ඔටෝ ෆ්‍රෑන්ක්*
මා වටා ලෝකය බිඳ වැටුණි... මට ප්‍රතිවිපාක වලට මුහුණ දීමට සිදුවිය. මෙයින් මා දැඩි සිත් වේදනාවට පත් වුනද ජර්මනිය යනු ලෝකයම නොවන බව වටහා ගත් මම සදහටම පිටත් වුනෙමි.'

1933 ජනවාරි 30 වන දින හිට්ලර් ජර්මනියේ චාන්සලර් බවට පත් වේ. නව නායකයෝ ඉක්මණින්ම සිය නියම අරමුණු ලොවට පැහැදිලි කරති. පළමු යුදෙව් විරෝධී නීති හඳුන්වා දෙනු ලබන අතර ජර්මනියේ යුදෙව්වන්ට හිංසා කිරීම අප්‍රමාදවම ඇරඹේ.

ඔටෝ ෆ්‍රෑන්ක්ට ජර්මනිය හැර යාමට කාලය පැමිණ ඇත. ව්‍යාපාරික සබඳතා ඇති නෙදර්ලන්තයේ රැකියාවක් සොයා ගැනීමට ඔහු උත්සාහ කරයි. සෙවීම සාර්ථක වන අතර ෆ්‍රෑන්ක් පවුල ඇම්ස්ටර්ඩෑම් වෙත සංක්‍රමණය වෙති.

1 ඔටෝ සංක්‍රමණය සඳහා කටයුතු පිළියෙළ කරන අතර ඈන් සහ මාගෝ සිය මව සහ මිත්තණිය සමඟ ආචන්හි (ජර්මනියේ) හොලන්ඩර් නිවසෙහි වාසය කරති.

2 1933 ජනවාරි 30 වන දින ඇඩොල්ෆ් හිට්ලර් ජර්මනියේ චාන්සලර් බවට පත් වේ.

3 යුදෙව්වන්ට එරෙහිව නාසීන්ගේ ප්‍රචණ්ඩත්වය ජාත්‍යන්තර මාධ්‍යයන්හි පුළුල්ව වාර්තා කෙරේ. එහෙත් මෙය හුදෙක් යුදෙව්වන්ගේ ප්‍රචාරයක් බව නාසීහු කියා සිටිති. 1933 අප්‍රේල් 1 වන දින ඔවුහු යුදෙව් නීතිඥයන්, වෛද්‍යවරුන්, සාප්පු සහ දෙපාර්තමේන්තු ගබඩා වර්ජනය කිරීම අරඹති.


4 ඈන්, එඩිත් සහ මාගෝ ෆ්‍රෑන්ක්, 1933 මාර්තු 10 වන දින. ෆ්‍රෑන්ක්ෆර්ට්හි (ජර්මනියේ) ටයිට්ස් දෙපාර්තමේන්තු ගබඩාවේ තිබූ ඡායාරූප ශාලාවේ බර කිරාගෙන ඒ අනුව පාස්පෝට් ඡායාරූපය ලබා ගත හැකි විය.



## ඒකාධිපතිවාදය

NSDAP පක්ෂය යුදෙව්වන් කොන් කරනවා පමණක් නොව ඔවුන්ගේ දේශපාලන විරුද්ධවාදීන් බවටද පත් වේ. කොමියුනිස්ට් සහ සමාජ ප්‍රජාතාන්ත්‍රවාදීන්ට විශේෂයෙන්ම හිංසා කරන අතර ඔවුහු දේශපාලන හිරකරුවන් වශයෙන් රඳවා තබන ලදී. සමහර කලා, සාහිත්‍ය සහ සංගීත කෘති තහනම් කෙරෙන අතර විදිවලදී පොත් පුළුස්සා දමනු ලැබේ. බොහෝ ලේඛකයෝ, කලාකරුවෝ සහ විද්‍යාඥයෝ විදේශගත වෙති. ප්‍රජාතාන්ත්‍රවාදය නැති කර දමනු ලැබේ. යුදෙව් ජාතික සිවිල් සේවකයින් සහ ගුරුවරුන් සේවයෙන් පහ කෙරේ.

1 බර්ලිනයේ NSDAP විදුලි පන්දම් පෙළපාලියක්, 1933.
2 1933 මාර්තු 23 දින හිට්ලර්ට ප්‍රජාතාන්ත්‍රික අනුමැතියක් රහිතව රට පාලනය කිරීමට ඉඩ දීමට පක්ෂව පාර්ලිමේන්තුව ඡන්දය ප්‍රකාශ කරයි. දැනටමත් අත් අඩංගුවට ගෙන නැති හෝ පැන ගිය නැති සමාජ ප්‍රජාතාන්ත්‍රික පාක්ෂිකයන් පමණක් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරති. කොමියුනිස්ට් පක්ෂය දැනටමත් තහනම් කර ඇත.
3 1933 මැයි මස සිදු වූ ප්‍රසිද්ධ පොත් ගිනි තැබීමක්. බොහෝ අය යුදෙව්වන් වූ මේවායෙහි කර්තෘවරු 'ජර්මානු නොවන' ලෙස හංවඩු ගසනු ලැබේ.
4 නායකයාණෙනි, අපි ඔබව අනුගමනය කරමු! සියල්ලෝම එකඟ වෙති. 1933 මැද භාගය වන විට සියලු දේශපාලන පක්ෂ තහනම් කෙරේ. අවසර දී ඇති එකම පක්ෂය වන්නේ NSDAP ය.
5 දේශපාලන විරුද්ධවාදීන් රැස් වේ, 1933 මාර්තු.





'ඕලන්දයට'

ඇන් ෆ්‍රෑන්ක්
'අප යුදෙව්වන් වූ නිසා මගේ පියා 1933 දී ඕලන්දයට සංක්‍රමණය කළේය. ඔහු ජෑම් සෑදීමට ගන්නා නිෂ්පාදන සාදන, ඕලන්ද ඔපෙටා සමාග මේ කළමනාකාර අධ්‍යක්ෂ බවට පත් විය.'

'ඔපෙටා' යන නමින් ජෑම් සඳහා අවශ්‍ය ජෙලි වර්ගයක් විකුණමින් ඔටෝ ෆ්‍රෑන්ක් සිය ව්‍යාපාරය ආරම්භ කරයි. ඇම්ස්ටර්ඩෑම්හි නව නිවාස සංවර්ධන ව්‍යාපෘතියක සාදන ලද, මර්වෙඩ්ප්ලේන්හි පිහිටි නිවසක ෆ්‍රෑන්ක් පවුල පදිංචි වෙති. ජර්මනියේ සිට තව තවත් සරණාගතයෝ අසල වාසයට පැමිණෙති. ගමේ පාසැලට යන ඇන් සහ මාගෝ ඉක්මණින්ම ලංදේසි බස උගනිති.

1 ඇන් පාසැලේදී, 1935.
2 ඔටෝ ෆ්‍රෑන්ක් සහ ඔහු යටතේ සේවයට බැඳුනු ඔහුගේ ලේකම් වන මීප් ගයිස් 1933දී.
3 ඇන් සිය මිතුරියන් වන ඊවා ගෝල්බර්ග් (වමේ) සෑන් ලෙඩර්මාන් (මැද) සමඟ මර්වර්ඩ්ප්ලයින්හිදී (ඇම්ස්ටර්ඩෑම්), 1936.
4 මාගෝ සහ ඇන් මිතුරියන් වූ එලන් වයින්බර්ගර් (වමේ සිට දෙවැනියා) සහ ගේබ්‍රියල් කාන් (දකුණේ) සමඟ. මෙම ඡායාරූපය ඇම්ස්ටර්ඩෑම්හි කාන් පවුලේ නිවසේදී ගන්නා ලද්දකි, 1934.




## ජර්මනිය නාසිකරණය වීම

ජර්මනියේ නීතිය සහ සාමය නැවත ස්ථාපනය වී ඇති අතර ආර්ථිකය දියුණු වෙමින් පවතී. නාසිවාදීහු තරුණ පරම්පරාව හදා වඩා ගැනීම සහ අධ්‍යාපනය ලබා දීම පාලනය කරති. ඒ ඔවුන් 'හොඳ නාසීන්' බවට පත් කිරීමේ අදහසිනි. මාධ්‍යවලින් (ගුවන් විදුලිය, පුවත්පත් සහ චිත්‍රපටවලින්) පෙන්වන්නේ නාසි අදහස් පමණි. හිට්ලර් සහ ඔහුගේ පක්ෂය වෙනුවෙන් දැඩි උද්යෝගයක් පවතී. විරුද්ධවාදීන් කිහිප දෙනෙකු සිටියද භීෂණයට සහ සිරගත කිරීමට බියෙන් ඔවුහු නිහඬව සිටිති. යුදෙව් විරෝධී ක්‍රම ගණනාවක් හඳුන්වා දෙනු ලැබේ. විරුද්ධතා නැත.

1 දැඩි සේ සංවිධානය කළ මහා රැස්වීම්වලින් විශාල සිතුවිලි ජනිත වේ.
2 විරැකියාවෙන් පෙළෙන්නන් මහා මාර්ග, රාජ්‍ය ගොඩනැඟිලි සහ සිවිල් ව්‍යාපෘති ඉදි කිරීමට යොදවනු ලැබේ. හිට්ලර් ආයුධ කර්මාන්තයක් සහ විශාල හමුදාවක් ඇති කිරීම ආරම්භ කරයි. විරැකියාව විශාල වශයෙන් පහළ බසියි.
3 තරුණ මහළු සියල්ලෝම නාසීන් ගැන උද්‍යෝගයෙන් පිරී සිටිති.
4 *'Youth Serves the Führer.*
*'All ten-year-olds in the Hitler Youth.*
5 නාසීන්ට යොවුන් පරම්පරාව ගොඩ නැගීම් සම්පූර්ණයෙන් පාලනය කිරීමට අවශ්‍ය වේ. පිරිමි ළමයින්ගේ ක්‍රියාකාරකම් හමුදාමය ස්වරූපයක් ගනියි. ගැහැණු ළමයින් භාර්යාවන් සහ මව්වරුන්ගේ කාර්ය භාරයට සූදානම් කරනු ලැබේ.




'මේ ඉන්නේ□ ඇන්□ හැන් සහ සැන්'

ඇන් ෆ්‍රෑන්ක්
'හැන් සහ සැන් මගේ හොඳම මිතුරියන් දෙදෙනා විය. අප එකට සිටිනවා දුටු අය 'මෙන්න ඇන්, හැන් සහ සැන්.' යනුවෙන් පැවසූහ.

හැනා ගොස්ලර් සහ සැන් ලෙඩර්මාන් දෙදෙනාම යුදෙව්වන් වූ අතර බර්ලිනියේ සිට පැමිණි අය වූහ. සරණාගත රැල්ල එන්න එන්නම වැඩි වෙයි. ජර්මනියේ සිට පළා ආ ජනතාව වැඩි වැඩියෙන් ඇන් සිටින ප්‍රදේශයේ වාසයට පැමිණියහ. ඇන්ගේ පංතියේ ළමයින්ගෙන් භාගය වැඩියෙන් යුදෙව්වන් වූහ.

1 ඇන්, සිය මිතුරියන් සමඟ වැලි පෙට්ටියක, 1937. හැනා වමේද, සැන් දකුණේද සිටිති.
2 ඇන මාගෝ
3 ඇන් ඇම්ස්ටර්ඩෑම් ආසන්නයේ, නගරයේ ළමයින් සඳහා වූ ගිම්හාන කඳවුරක 1937.
4 ඇන්ගේ පංතියේ යුදෙව් ළමයින් ගණනාවක් සිටින අතර බොහෝ අය පැමිණ ඇත්තේ ජර්මනියෙනි.



## ජාතිය පිළිබඳ නීති

1935දී 'ජාතිය පිළිබඳ නීති' හඳුන්වා දෙනු ලැබේ. දැන් ඊනියා 'ජර්මන් ලේ' තිබෙන අයට සම්පූර්ණ පුරවැසිභාවය ලබා ගත හැක. අනෙක් සියල්ලන්ට ඇත්තේ අඩු අයිතිවාසිකම්ය. හිට්ලර්ගේ පරමාදර්ශය වන්නේ 'ජාතියක් වශයෙන් පවිත්‍ර වූ ජර්මන් ජනතාවකි. ඔහුට අනුව ජර්මනියේ 'ආර්ය ජාතිය' අනෙක් සියලු ජාතීන්ට වඩා උසස්ය. නාසිහු යුදෙව් ජාතිකයන් පහත් ලෙස පමණක් නොව භයානක ලෙසද දකිති. 'යුදෙව්වන්' ඊනියා 'ආර්ය ජාතිය' විනාශ කිරීමෙහි කුමන්ත්‍රණයක ලොව පුරා නිරතව සිටින බවට වූ මුලාවක ඔවුහු වැටී සිටිති. යුදෙව් ජනතාව වැඩි වැඩියෙන් සීමාවන්ට ලක් වේ. ඒ එකම අරමුණක් ඉටු කිරීමටයි, ඒ යුදෙව්වන්, යුදෙව් නොවූ ජනයාගෙන් වෙන් කිරීමයි.

1 ජනතාව 'ජාතීන්' අනුව බෙදිය හැකි බවත් තමා අයත් 'ආර්ය ජාතිය' උසස් බවත් නාසීහු විශ්වාස කරති. ළමයකු 'ජාතියක විශේෂ ලක්‍ෂණ' පිළිබඳ පරීක්‍ෂාවට ලක් වෙමින්.

2 පාසැල් ළමයින්ට 'ජාතිවාදී අධ්‍යයනය' පිළිබඳ පාඩම් කියා දෙනු ලැබේ.

3 'ජාතිය දුර්වල වීම' වැළැක්වීමට ආබාධිත පුද්ගලයන් මරා දැමීමට හිට්ලර් ආඥාවක් නිකුත් කරයි. මරා දැමූ 80,000ක් ආබාධිතයන් අතර මේ දැරියද වෙයි.

4 නාසිහු කළු ජාතිකයන්ද 'පහත්' ලෙස සලකති. 1930 දී ජර්මනියේ කළු ජාතිකයෝ 20,000ක් පමණ ජීවත් වෙති. 1937 දී කළු ළමයින් 385ක් රහසේම වන්ද්‍යාකරණයට පත් කරනු ලැබේ.

5 රෝමා (අභිකුණ්ටක) ළමයින් තිස් නව දෙනෙක් ජර්මනියේ මල්ෆින්ජන් නගරයේ ශාන්ත ජෝශප් ෆ්ලේග සායනයේ ඊනියා ජාතිවාදී අධ්‍යයන වලට ගෙන එනු ලැබේ. 1944 දී අවුට්ස්විච් වෙත ගෙන එන ළමයින්ගෙන් බහුතරය ගෑස් කුටිවල මරා දමනු ලැබේ. අනෙක් අයව වෛද්‍ය පර්යේෂණවලට බලෙන්ම යොදා ගනු ලැබේ. දිවි ගලවා ගන්නේ හතර දෙනෙකු පමණි.




'අපේ ජීවිතවල සාංකාව නොතිබුණා නොවේ'

ඈන් ෆ්‍රෑන්ක්
'අපේ ඥාතීන් හිට්ලර්ගේ යුදෙව් විරෝධී නීතිවලින් පීඩා විඳිමින් සිටියහ. එනිසා අපේ ජීවිතවල සාංකාව නොතිබුණා නොවේ. 1938 සිදුවූ වධ බන්ධනවලින් පසු මගේ මාමලා දෙදෙනෙකු (මවගේ සහෝදරයෝ) ජර්මනියෙන් පැන ගියහ. ඔවුහු උතුරු ඇමෙරිකාවේ ආරක්ෂිතව රැකවරණ ලබා ගත්හ. මගේ වැඩිමහල්ම මිත්තණිය අප සමඟ වාසය කිරීමට පැමිණියාය. ඒ වන විට ඇයට අවුරුදු හැත්තෑ තුනක් විය.'

ඔටෝ සහ එඩිත් ෆ්‍රෑන්ක් අනෙකුත් ජර්මානු සරණාගතයන් දැන ඇඳින ගනිති. ඔවුන්ට හර්මාන් සහ ඔගස්ටේ වැන් පෙල්ස් සහ ඔවුන්ගේ පුත් පීටර් සහ ෆ්‍රිට්ස් ෆෙෆර් හමුවෙති. සියල්ලෝම පසුව ඔවුන් සමඟ එකට සැඟවෙති. වැන් පෙල්ස් පවුල 1937දී ඔස්නාබෲක්වලින් පැන යයි. හර්මාන් වැන් පෙල්ස් ඔටෝ ෆ්‍රෑන්ගේ ව්‍යාපාරයේ හවුල්කරුවෙකු බවට පත් විය. ඈන්ගේ මාමාවරු මෙන්ම ෆ්‍රිට්ස් ෆෙෆර්ද ජර්මනිය හැර ආවේ පළිඟු රාත්‍රියකට පසුවය.

1 ඈන් (වමේ සිට දෙවැනියා) 1940/1941 ශ්‍රීත ඍතුවේ, ඇම්ස්ටර්ඩෑම්, වොන්ඩර්පාක්හිදී. ඇය ෆිගර් ස්කේටිංවලට දැඩි සේ ආශා කළාය. මේ ඈන් ස්කේටිං කරනවා පෙන්වන ඉතිරිව ඇති එකම ඡායාරූපයයි.
2 ඈන්ගේ මිත්තණිය වන හොලන්ඩර් 1939 මාර්තු මස ඇම්ස්ටර්ඩෑම්හි ෆ්‍රෑන්ක් පවුල හා වාසයට පැමිණෙයි. ඇය 1942 දී මිය යයි.
3 පීටර් වැන් පෙල්ස් (මැද) ජර්මනියේ ඔස්නාබෲක්හිදී යුදෙව් බාල දක්ෂ පෝතක කඳවුරකදී සිය මිතුරන් සමඟ, 1936දී
4 ෆ්‍රිට් ෆ්‍රෙෆර් සිය යුදෙව් නොවන පෙම්වතිය වූ චාලට් කැලටා සමඟ. ජර්මනියේ, යුදෙව් සහ යුදෙව් නොවන ජාතිකයන් අතර විවාහ 1935 සිට තහනම් කර තිබුණි. නෙදර්ලන්තයද ජර්මන් නීතියට ගරු කළ හෙයින් ඔවුන්ට එහිදීද විවාහ විය නොහැකි විය.



## යුදෙව්වන්ට වද හිංසා කිරීම ඇරඹේ

1938 නොවැම්බර් 9-10 දිනවල රාත්‍රියේ (ඊනියා 'පළිඟු රාත්‍රිය' හෙවත් වීදුරු කැඩුණු රාත්‍රිය) නාසින් විසින් යුදෙව්වන්ට එරෙහිව පහරදීම් මාලාවක් සංවිධානය කළහ. එක් රැයක භීෂණයෙන් යුදෙව් ශාලා 177 විනාශ කරන ලදි. යුදෙව් සාප්පු 7500ක් කුඩු කර යුදෙව්වන් 235ක් මරා දමන ලදි. 30,000ක් පමණ අත්අඩංගුවට ගෙන දේශපාලන සිර කඳවුරුවලට යවනු ලැබේ. අනතුරේ ස්වභාවය පැහැදිලි වන්නේ දැන් ය. යුදෙව්වන් ගණනාවක් ජර්මනියෙන් පැන යාමට තීරණය කරති. එහෙත් තව තවත් රටවල් සරණාගතයන්ට සිය දේශ සීමා වසා දමමින් සිටිති.


1 බෙල්ජියමේ ඇන්ඩ්වර්ප්හි 'ශා.ලූයිස්' වරායේ නැව්ගත වීමට සූදානමින් සිටින යුදෙව් සරණාගතයින්. 1939 ජූනි 17.

2 1938 නොවැම්බර් 10 වන දින උදෑසන, බර්ලිනයේ පොට්ස්ඩෑමර් වීදියේකඩා බිඳ දැමූ සාප්පුවක් පසු කර ගෙන යන පිරිස්. 'පළිඟු රාත්‍රිය' යන්නෙහි අරුත පාරවල්වල විසිරී ඇති වීදුරු කැබලිය

3 'පළිඟු රාත්‍රිය' රාත්‍රියෙන් පසු ජර්මනියේ ඔල්ඩන්බර්ග්හි අත් අඩංගුවට ගෙන ඇති යුදෙව්වන්.

4 බ්‍රිතාන්‍යයට පැමිණෙන යුදෙව් සරණාගත දරුවන්, 1938. එම රටට තවමත් ළමයින් භාර ගත් අවස්ථා ඇත. ඔවුන්ගෙන් බොහෝ අය නැවතත් සිය දෙමාපියන් නොදකිනු ඇත.

5 1938 නොවැමබර් 9-10 දින 'පළිඟු රාත්‍රියේ' ගිනි ගන්නා යුදෙව් ශාලාවක්.




## යුද්ධය

1939 සැප්තැම්බර් 1 වන දින ජර්මන් හමුදාව පෝලන්තය ආක්‍රමණය කරති. ජර්මන් යටත්විජිතවාදීන්ට පදිංචි වීමට හමුදාව විසින් විශාල ප්‍රදේශයක් සුද්ධ කරනු ලැබේ. බොහෝ ප්‍රසිද්ධ පෝලන්ත ජාතිකයන් මරා දමනු ලැබේ. පෝලන්තයේ සිදුවන දාමරිකකම් පිළිබඳ තොරතුරු බටහිර යුරෝපයට ගලා යන්නේ අල්ප වශයෙනි.
1940 දී නෙදර්ලන්තය, බෙල්ජියම සහ ප්‍රංශයද ජර්මන් හමුදාව විසින් ආක්‍රමණය කරනු ලැබේ. පෝලන්තයට සාපේක්ෂව, මේ රටවල සිටින යුදෙව් නොවන ජනතාව නාසින් විසින් දකින්නේ එකම ජාතියක සාමාජිකයන් ලෙසය. ඔවුන්ට එරෙහිව පෝලන්තයේදී සිදුවූ තරම් කුරිරුකම් සිදු වන්නේ නැත. නෙදර්ලන්තයට පැමිණි පළමු වර්ෂයේදී යුදෙව්වන් ලියාපදිංචි කිරීම ඇරඹේ.

1 1939දී දෙවන ලෝක යුද්ධය ඇරඹේ.
2 පෝලන්තයේ පෙරටුගාමී හමුදාවට පිටුපසින් යුදෙව්වන්ට එරෙහි භීෂණය ක්ෂණිකවම ඇරඹේ. යුදෙව්වන්ට ප්‍රසිද්ධියේම නින්දා පමුණුවන අතර වීදිවලදී පහර දෙනු ලැබේ. රැඳී සිටින හමුදා විසින් වධ බන්ධන සිදු කර දහස් ගණන් යුදෙව්වන් මරා දමනු ලැබේ.
3 ඇම්ස්ටර්ඩෑම්හි ඔටෝ ෆ්‍රෑන්ගේ ව්‍යාපාරය ආසන්නයට ජර්මන් හමුදාව පැමිණීම, 1940 මැයි 16.
4 මුලින්ම නාසීහු ඕලන්ද ජනතාව තම පැත්තට හරවා ගැනීමට තැත් කරයි. එහෙත් එය සාර්ථක වන්නේ ස්වල්ප වශයෙනි. හමුදාවට සහාය දෙන්නේ ටික දෙනකු පමණි.
5 වෝර්සෝ, 1939 සැප්තැම්බර් 14. ජර්මන් ගුවන් යානයක් නගරයට පහර දෙන අයුරු තැවුල් සහිතව බලා සිටින පෝලන්ත ළමයින්.




'යුදෙව්වන්ට කරදර ඇති වීම ආරම්භ විය'

ඈන් ෆ්‍රෑන්ක්
'1940 මැයි මාසයෙන් පසුව හොඳ කාල සීමිත වූ අතර බොහෝ කාලාන්තරයකට පසුව උදා විය. මුලින්ම යුද්ධයක් ඇති විය, ඉන් පසුව යටත් වීම් සිදු වූ අතර ඊළඟට ජර්මානුවන් පැමිණියහ. යුදෙව්වන්ට කරදර ආරම්භ වූයේ එවිටය.' (ඈන් ෆ්‍රෑන්ක්)

ඈන්ගේ දහවන උපන් දිනයෙන් මාස කිහිපයකට පසුව දෙවන ලෝක යුද්ධය ඇරඹේ. ඔටෝ සහ එඩිත් නෙදර්ලන්තය යුද්ධයට සහභාගී නොවනු ඇතැයි බලාපොරොත්තු වෙති. එහෙත් 1940 දී මැයි මාසයෙන් පසු හොඳ කාලයන් තිබුණේ කලාතුරකිනි. දින ජර්මන් හමුදාව එය ආක්‍රමණය කරයි. නාසිහු යුදෙව් සහ යුදෙව් නොවන ජාතිකයන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ඉක්මණින්ම ආරම්භ කරති. වර්ෂයකට පසුව නෙදර්ලන්තයේ සිටින යුදෙව්වන්ගේ නම් සහ ලිපින බහුතර නිලධාරීන් දැන ගනිති.

1 ෆ්‍රෑන්ක් පවුල ඇම්ස්ටර්ඩෑම්හි මර්වඩන්ප්ලයින් හිදී.
2 ඈන් (දකුණේ සිට තෙවැන්නිය), ඇග් පියා (වමේ සිට තෙවැන්නා සහ අනෙකුත් අමුත්තන් 1941 ජූලි 16වන දින ඇම්ස්ටර්ඩෑම්හි පැවති, ජැන් ගයිස් සහ මයිප් සැන්ට්ෂිට්ගේ විවාහ උත්සවයේදී.
3 ඈන්, ඇගේ ගුරුවරිය සහ පංතියේ මිතුරියන් දෙදෙනකුගේ 1940 ඡායාරූපයක්. වමේ සිට දකුණට - මාර්තා වෑන් ඩෙන් බර්ග්, ගුරුවරිය මාගරිතා ගොඩ්‍රන්, ඈන් සහ ලො සැලමන්.
4 ඕලන්දයේ නාසින් ඇම්ස්ටර්ඩෑම්හි යුදෙව් නිල නිවාස හරහා පෙළපාලි යති. ඔවුහු බොහෝ විට යුදෙව් ජාතිකයන් කෙරෙහි ප්‍රචණ්ඩත්වය පතුරුවති.



## තනි කිරීම

යුදෙව්වන්ගේ නම් සහ ලිපින දැන ගත් විට ඔවුන් තනි කිරීම ආරම්භ කළ හැක. නාසිහු විසින් යුදෙව් විරෝධී ක්‍රම වේගයෙන් හඳුන්වා දෙති. මෙහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ යුදෙව් නොවන ජාතීන් යුදෙව්වන් සමඟද යුදෙව්වන් අනෙක් ජාතීන් සමඟද ඇසුරු කිරීමට බිය වෙති.

1 ජර්මනියේ සහ හමුදාව පාලනය කරන බොහෝ ප්‍රදේශවල යුදෙව්වන්ට කහ පාට තරුවක් පළඳින ලෙස බල කරනු ලැබේ.
2 ඕලන්ද ජාතිකයන් සහ ජර්මන් හමුදාව අතර පළමු විවෘත ගැටුම ඇරඹෙන්නේ 1941 පෙබරවාරි මස්දීය. ඒ යුදෙව් පිරිමින් 427ක් එකතු කර මතෝසන් රැඳවුම් කඳවුරට ගෙන යාමෙනි. ඇම්ස්ටර්ඩෑම් සහ අවට ප්‍රදේශවාසීහු යුදෙව්වන්ට වද හිංසා පැමිණවීමට විරෝධය පළ කරති. එහෙත් දින දෙකකට පසු මෙම වර්ජන ප්‍රචණ්ඩ ලෙස විසිරුවා හරිනු ලබේ.
3 නිලධාරීන්ගේ නියෝගයෙන් 'යුදෙව්වන්ට අවසර නැත' හෝ 'මෙහි යුදෙව්වන් පිළිගනු නොලැබේ' යන පුවරු දර්ශනය කෙරේ.
4 නැඟෙනහිර යුරෝපයේ 'කාර්ය බලකාය හමුදා ඒකකවලට, හැකිතාක් යුදෙව්වන්ද, අභිකුණ්ඨිකයන්ද., පක්ෂග්‍රාහීන්ද හැකිතාක් මරා දැමීමේ කාර්යය පැවරී ඇත. එක් වර්ෂයක් තුළ පිරිමින්, කාන්තාවන් සහ ළමයින් මිලියනයක් මරා දමන ලද බවට ඇස්තමේන්තු කෙරේ.
5 1942 මැයි 3 වන දින සිට නෙදර්ලන්තයේ අවුරුදු හයට වැඩි සියලු යුදෙව් දරුවන්ට කහ තරුවක් පැළඳීමට සිදු වේ.




## 'යුදෙව් විරෝධී තීන්දු මාලාවක'

ඈන් ෆ්‍රෑන්ක්
'යුදෙව් විරෝධී නීති මාලාවක් මගින් අපේ නිදහස දැඩි ලෙස සීමා කරන ලදි. යුදෙව්වන්ට කහ පාට තරුවක් පැළඳීමට නියම කරන ලදි. ඔවුන්ට බයිසිකල්වලින් යාමට නියම කරන ලදි. යුදෙව්වන්ට ට්‍රෑම් භාවිත කිරීම තහනම් විය. තමාගේම කාරය හෝ පැදවීම යුදෙව්වන්ට තහනම් විය. යුදෙව්වන්ට පව 3.00 සහ 5.00 අතර කාලය තුළ වෙළඳපලට යාමට නියම විය. ඔවුන්ට නිතර නිතර යුදෙව්වන්ට අයත් කොණ්ඩා කපන තැන් සහ රූපලාවන්‍යාගාරභාවිතා කිරීමට නියම විය. ඔවුන්ට රාත්‍රී 8.00 සහ පෙව 6.00 දක්වා කාලය තුළ මහ මග ගමන් කිරීම තහනම් කෙරේ.'


යුදෙව් ළමයින්ට වෙනමම යුදෙව් පාසැල්වලට යාමට සිදු විය, ඈන් සහ මාගෝට්ද ලයිසියම් යුදෙව් පාසැලට යාමට සිදු විය. යුදෙව්වන්ට තවදුරටත් සිය ව්‍යාපාර කරගෙන යාමට ඉඩ නොදුන් හෙයින් ඔටෝ ෆ්‍රෑන්ක් ජොහැන්ස් ක්ලයිමාන් සමාගමේ අධ්‍යක්‍ෂක ලෙස නම් කරනු ලැබේ. එහෙත් ඔටෝ තවදුරටත් තිරයෙන් පිටුපස සිට ක්‍රියාත්මක වෙයි. සමාගමටද මීප් ගයිස්ගේ ස්වාමි පුරුෂයා වූ ජෑන් ගයිස්ගේ නම අනුව ගයිස් ඇන්ඩ් කම්පැණි යන නම ලබා දෙන ලදි.

### රහස් සැලැස්මක්

සියලු යුදෙව් විරෝධී ක්‍රියාමාර්ගවලට යටින් ඇත්තේ හිට්ලර්ගේ රහස් සැලසුමකි. යුරෝපයේ සිටින යුදෙව්වන් මිලියන 11ම මරා දැමෙනු ඇත.

මෙම තීරණය 1942 ජනවාරි මාසයේ බර්ලින්හිදී නිවසක පැවති රහස් රැස්වීමකදී ඉහළ පංතියේ නාසි නායකයන් විසින් විස්තරාත්මකව සැලසුම් කරන ලද්දකි. ඊනියා වන්සි සම්මේලනය යනු මෙය විය. යුදෙව්වන් කිසි දෙයක් සැක නොකළ යුතුය. ඔවුන්ව කම්කරු කඳවුරුවලට යවන බව කියන ලදි. ඇත්තෙන්ම ඔවුන්ව යැව්වේ විශේෂයෙන් ඉදිකළ කළ සමූලඝාතක කඳවුරුවලට විය. ඒවායින් බහුතරය පෝලන්තයේ තිබූ අතර ඒවා වේගවත්ව සහ කාර්යක්‍ෂමව. මරා දැමීමටත් හැකිතාක් විශාල සිරුරු ප්‍රමාණයක් ආදාහනය කිරීමටත් විශේෂයෙන් සැලසුම් කර තිබුණි. 1942 දී මෙම කඳවුරුවලට මහා පරිමාණයෙන් යැවීම අරඹනු ලැබේ. එහි යවන යුදෙව්වන්ගෙන් බහුතරය පැමිණි වහාම මරා දමනු ලැබේ. ඉතිරි අයව පහර දෙමින් වහල් සේවයේ යොදවන අතර ඔවුහු වෙහෙස නිසාම මරණයට පත් වෙතිහැකිතාක් විශාල සිරුරු ප්‍රමාණයක් ආදාහනය කිරීමටත් විශේෂයෙන් සැලසුම් කර තිබුණි. 1942දී මෙම කඳවුරුවලට මහා පරිමාණයෙන් යැවීම අරඹනු ලැබේ. එහි යවන යුදෙව්වන්ගෙන් බහුතරය පැමිණි වහාම මරා දමනු ලැබේ. ඉතිරි අය වෙහෙස වී මිය යන තෙක්ම වහල් සේවයේ යොදවන ලදි.

1 ඈන් ඇම්ස්ටර්ඩෑම් ළදරු පාසැලේදී, 1941.
2 වන්සී සම්මේලනයේදී යුරෝපයේ සිටින යුදෙව් ජාතිකයන් සංඛ්‍යාව ගණනය කරනු ලැබේ.




'හැම දෙයක් කෙරෙහිම ඔබ ගැන විශ්වාසය තැබීමට හැකි යැයි මම සිතමි'

ඇන් ෆ්‍රෑන්ක්

'හැම දෙයක් කෙරෙහිම ඔබ ගැන විශ්වාසය තැබීමට හැකි යැයි මම සිතමි, මක් නිසාද යත් මට කිසි දාක කිසිවකු විශ්වාස කළ නොහැකි වූ හෙයිනි. ඔබ මට සැනසුම සහ සහය ලබා දෙන මහඟු සම්පතක් යැයි මම සිතමි.'

ඇන්, 1942 ජූනි12 දින ඇගේ දහතුන්වන උපන් දිනයට ලැබෙන දින පොතේ පළමු පිටුවේ එසේ ලියයි. ඇය පාසැල, මිතුරියන් සහ එතෙක් ඇය ගත කළ ජීවිතය ගැන මෙම දිනපොත ලියන්නේ කිටි යන මනස්කල්පිත මිතුරියකටය. සති තුනකට පසුව ඇගේ ජීවිතය සම්පූර්ණයෙන් වෙනස් වනු ඇතැයි ඇයට නොසිතේ.

1 ඇන්ගේ දිනපොත
2 ඇන් ෆ්‍රෑන්ක් 1935-1942
3 ඇන්ගේ දිනපොත සමහර පිටුවල ඇගේ පාස්පෝට් ඡායාරූප අලවා ඒවා මත අදහස් දක්වා ඇත.
4 ඇන්ගේ දිනපොතේ අත් අකුරු වර්ග දෙකක් මාරුවෙන් මාරුවට ඇත. සමහර විට ඇය ලොකු අකුරුවලින් ලියන අතර බොහෝ විට ඇලවූ වැල් අකුරුද ලියයි.




'මම පුදුම වුනෙමි කැඳවීමකී'

ඇන් ෆ්‍රෑන්ක්
'තුනට...... දොරේ සීනුව නාද විය. මම බැල්කනියේ කුසීතව කියවමින් සිටි නිසා එය ඇසුනේ නැත. ස්වල්ප වේලාවකට පසු මාගෙ ා් වික්ෂිප්ත පෙනුමෙන් යුතුව මුළුතැන්ගෙයි දොර අසළ පෙනී සිටියාය. 'තාත්තාට එස් එස් ගෙන් කැඳවීමක් ලැබුණා, ඇය රහසින් කීවාය... මම පුදුම වුනෙමි. කැඳවීමක්. ඒ කුමක්දැයි හැමෝම දනිති. දේශපාලන කඳවුරු, පාළු සිර මැදිරි මගේ මනසේ මැවෙන්නට විය.'

ඇන්ගේ උපන් දිනයෙන් සති තුනකට පසු 1942 ජූලි 5 වන දින අධිකාරීන් වෙත වාර්තා කරන ලෙස මාගෝට කැඳවුම් නිවේදනයක් ලැබේ. ඇයව ජර්මනියේ 'ශ්‍රම කඳවුරකට' යැවීමට නියමිතය. මේ කැඳවීම ඇන්ගේ දෙමාපියන්ට සම්පූර්ණ පුදුමයක් නොවේ. 1942 සිට ඔටෝ ෆ්‍රෑන්ක් සිය 'රහස් ඇනෙක්සියෙ' සැඟවීමට කටයුතු සූදානම් කරමින් සිටියේය. එය ඔහුගේ ප්‍රින්සන්ග්‍රාෆ්ට්හි පිහිටි කාර්යාලයේ කොටසකි. මේ සැලසුම ගැන දන්නේ ඔහුගේ වඩාත්ම විශ්වාසවන්ත සේවකයන් පමණි. වහාම සැඟ වීමට තීරණය කරනු ලැබේ.

1 මාගෝ ෆ්‍රෑක්, යුදෙව් ලයිසියම් පාසැලේදී, 1941 දෙසැම්බර්.
2 ඇන්ගේ පාස්පෝට් ඡායාරූපයක්, 1942 මැයි. බොහෝ විට ඇගේ අවසන් ඡායාරූපය විය හැකියි.
3 කැඳවුම් නියෝගයක් සහ පිටුවහල් කරන්නන් ගෙන ආ යුතු භාණ්ඩවල ලැයිස්තුවක්.
4 පසුවදාම සැඟවීමට ෆ්‍රෑන්ක් පවුල තීරණය කරති. සැඟවෙන ස්ථානයට හැකිතාක් භාණ්ඩ ගෙන ඒමට මීප් ගයිස් සහ අනෙකුත් උදව්කරුවෝ එදින හවසම පැමිණෙති.




## 'සැඟවීමට හොඳම තැනකි'

ඇන් ෆ්‍රෑන්ක්
'ඇනෙක්සිය සැඟවීමට කියාපු තැනකි. එය තෙත් සහ පැත්තකට බර එකක් වුවද ඇම්ස්ටර්ඩෑම්හි, නැහැ, මුළු ඕලන්දයේම ඊට වඩා සුව පහසු සැඟ වුම් ස්ථානයක් නොතිබෙන්නට ඇත.' (ඇන් ෆ්‍රෑන්ක්)

සැඟවුම් ස්ථානය ඔටෝ ෆ්‍රෑන්ක්ගේ කාර්යාලවල හිස් කොටසක පිහිටා ඇත. පසුව වෑන් පෙල්ස් පවුල සහ ෆ්‍රිට් ෆෙෆර්ද එතැනදී ෆ්‍රෑන්ක් පවුල හා එක් වෙති. ඊළඟ අවුරුදු දෙකේ මේ අට දෙනා, පිටත ලෝකයෙන් හුදකලාව මේ රහස් ඇනෙක්සියෙ වෙසෙති. එය බියෙන් සැකයෙන් මෙන්ම තර්ක විතර්කවලින්ද දුෂ්කර අලසකමින්ද පිරුණු යුගයකි. ඔටෝ ෆ්‍රෑන්ක්ගේ විශ්වාසවන්ත සේවකයින්ගෙන් හතර දෙනෙකු සැඟව සිටින අට දෙනාට ආහාර, ඇඳුම් සහ පොත් සපයති.

1 ප්‍රින්සන්ග්‍රාක්ට් ගොඩනැගිල්ල. සැඟවුම් ස්ථානය වන 'රහස් ඇනෙක්ෂිය', ඇත්තේ පිටුපසිනි..

2 රහස් ඇනෙක්ෂියේ වාසය කරන්නෝ

| | |
|---|---|
| ඔටෝ ෆ්‍රෑන්ක් | එඩිත් ෆ්‍රෑන්ක් |
| මාගෝ ෆ්‍රෑන්ක් | ඇන් ෆ්‍රෑන්ක |
| හර්මන් වෑන් පෙල්ස | ඔගස්ටේ වෑන් පෙල්ස් |
| පීටර් වෑන් පෙල්ස් | ෆ්‍රිට්ස් ෆ්ෆෙෆර් |

3 උදව්කරුවෝ

| | |
|---|---|
| මීප් ගයිස් | වික්ටර් කුග්ලර් |
| ජොහැන්නස් ක්ලයිමාන් | බෙප් වොක්කුජිල් |




'අප සැඟව සිටින ස්ථානය සොයා ගෙන අපට වෙඩි තබනු ඇතැයි මම බියට පත්ව සිටිමි'

ඈන් ෆ්‍රෑන්ක්
'එළියට යාමට නොහැකි වීම මට කියන්න බැරි තරමට දුකකි. අප සැඟව සිටින තැන එළි වී අපට වෙඩි තබනු ඇතැයි මම බියට පත්ව සිටිමි.'

දිවා කාලයේදී මිනිසුන් ගොඩනැගිල්ලේ වැඩ කරන විට රහස් ඇනෙක්සියෙ පදිංචිකරුවන්ට ඉතා නිහඬව සිටීමට
සිදු වේ. ගුදමේ සේවකයෝ ඔවුන් එහි සිටින බව නොදනිති. වැසිකිළියේ සිට අපද්‍රව්‍ය යන නලය ගුදම හරහා යන හෙයින්, එය හැකිතාක් අඩුවෙන් ෆ්ලෂ් කළ යුතුය. සියලුම ජනෙල්වලට බිලැන්කට් දමා ආවරණය කර ඇති හෙයින් අසල්වැසියන්ට ඇතුළ බැලිය නොහැක. රහස් ඇනෙක්සියට යන දොර පොත් රාක්කයකින් වසා ඇත. දිගු නිහඬ හෝරාවන්හිදී ඈන් තම පාසැල් පොත් කියවයි. නැතහොත් අනෙක් අය සමඟ ක්‍රීඩා කරයි, දිනපොත ලියයි.

රහස් ඇනෙක්ෂිය

1 පොත් රාක්කය.
2 ඈන් සහ ෆ්රිට්ස් ෆ්රෙෆර්ගේ කාමරය.
3 ඔටෝ, එඩිත් සහ මාගෝගේ කාමරය.
4 හර්මන් සහ ඔගස්ටේ වැන් පෙල්ස්ගේ කාමරය, කෑම කාමරයද මෙයම විය.
5 පීටර් වැන් පෙල්ගේ කාමරය.
6 නාන කාමරය සහ වැසිකිළිය.
7 ගබඩා අට්ටාලය.

ව්‍යාපාර ස්ථානය

8 ගුදම.
9 උදව්කරුවන් වැඩ කරන කාර්යාලය.
10 කාර්යාල ගබඩා කාමරය.

1 ප්‍රින්සන්ග්‍රාක්ට් 263හි ඇති ගොඩනැගිල්ල (2000දී). පිටුපස මෙහි රතු පාටින් දක්වා ඇත්තේ රහස් ඇනෙක්ෂියේ සැඟවුණු ස්ථානයයි.
2 අසව් සහිත පොත් රාක්කය රහස් ඇනෙක්ෂියට ඇති ඇතුල් වීමේ දොරටුව සඟවයි.
3 ඈන් සහ ෆ්‍රිට්ස් ෆෙෆර්ගේ කාමරය. ඈන් ඡායාරූපවලින් බිත්ති සරසා ඇත. අවුරුදු කිහිපයකට පෙර රහස් ඇනෙක්ෂිය ඔවුන් සැඟවී සිටියදී තිබෙන්නට ඇතැයි සිතූ ආකාරයට තාවකාලිකව සාදන ලද්දේ චිත්‍රපටයක් සඳහාය.




'හැම දෙනාම මරණය වෙත පෙරහැරකින් ගෙන යනු ලැබේ

ඇන් ෆ්‍රෑන්ක්
'සැඟවුනොත් හැර ඔවුන්ගේ අත් අඩංගුවෙන් ගැලවිය නොහැක. කිසිවකුට ගැලවීමක් නොලැබේ. අසනීප අය, වයස් ගත අය, ළමයින්, ළදරුවන්, ගැබිණි කාන්තාවන් - සියලු දෙනාම මරණය කරා ගෙන යනු ලැබේ.'

යුදෙව්වන් මරා දමන බවට පුවත් රහස් ඇනෙක්සියෙ පදිංචිකරුවන්ට පිටතින් ලැබේ. ගුවන් විදුලියෙන් ඔවුන්ට ගෑස් මගින් මරා දැමීම ගැන අසන්නට ලැබේ. ඔවුන්ට බියද අසරණ බවද දැනේ. සමහර අවස්ථාවල ඇන්ට පීඩනය දරා ගත නොහැකි බවක් දැනේ. ඇය බොහෝ විට විප්ලවකාරී වන අතර අනෙක් අයට නපුරුය. ඇය නිතර කණස්සල්ලෙන්ද විශාද ගතියෙන්ද පසු වේ. අන් අය සමග නිසි ලෙස කතා කළ නොහැකි යැයි හැඟෙන බොහෝ දේ ඇයට ඇත. දිනපොත ඇගේ හොඳම මිතුරියයි.

1 සෑම දිනකම ඇන් සිය සිතුවිලි, හැඟීම් සහ අත්දැකීම් ගැන ලියයි. මාස කිහිපයකින් පසුව දිනපොත පිරේ. බෙප් විසින් දුන් සටහන් පොත්වල ඇය දිගටම ලියයි.
2 ඇම්ස්ටර්ඩෑම්හි යුදෙව්වන් නෙරපා හැරීම,1943 ගිම්හානය. සිය මිතුරන් සහ පංතියේ සගයින් අත් අඩංගුවට ගෙන ඇති බව ඇන්ට අසන්නට ලැබේ. මුලින් උදව්කරුවෝ පිටත ලෝකයේ සිදුවන දේ ඔවුන්ට කියති. එහෙත් පසුව ඔවුහු එය නවත්වති.
3 උදව්කරුවෝ රහස් ඇනෙක්සියෙ පදිංචිකරුවන්ගේ ආධ්‍යාත්මය නොවැටී පවත්වා ගැනීමට උත්සාහ කරති. ඔවුහු ආහාර, පොත්, පුවත්පත් සහ සඟරා ගෙනත් දෙති. ඇන් සිනමාව සහ නාට්‍යය යන සඟරාවට විශේෂයෙන් කැමතිය.
4 ඔටෝ, එඩිත් සහ මාගෝගේ කාමරය. තම කාමරයේ ෆ්‍රිට්ස් සිටින නිසා ඇය දිවා කාලය මෙහි ගත කරයි.




'මා කෙදිනක හෝ මාධ්‍යවේදිනියක හෝ ලේඛිකාවක වේද?'

ඈන් ෆ්‍රෑන්ක්
'... මා කෙදිනක හෝ මාධ්‍යවේදිනයක හෝ ලේඛිකාවක වේද?' මම එසේ සිතමි, ඔව් මම මහත් බලාපොරොත්තුවෙන් එසේ සිතමි. ලිවීමෙන් මට හැම දෙයක්ම වාර්තා කළ හැකිය. මගේ සිතුවිලි, පරමාදර්ශ සහ සිහින.'

ලිවීමට ඇති කුසලතාවත්, ඊට ඇති ආශාවත් ඈන් සොයා ගෙන ඇත. 1944 මාර්තු 28වන දින ඇයට ගුවන් විදුලි ප්‍රචාරයකින් දැන ගන්නට ලැබෙන්නේ යුද්ධයෙන් පසුව ඕලන්ද රජය දිනපොත් එකතුවක් සාදන බවයි. එය පසුව පොතක් ලෙස පළ කිරීමේ අදහසින් ඈන් නැවතත් තම දිනපොත ලිවීමට තීරණය කරයි. ඇය ඊට මාතෘකාවක් පවා සිතා ඇත. රහස් ඇනෙක්සිය. මිත්‍ර හමුදා නෝමැන්ඩි වෙත පැමිණ ඇති බවත් ජයග්‍රහණය කරමින් සිටින බවත් දැන ගැනීමෙන් රහස් ඇනෙක්ෂියේ වාසීන්ගේ නිදහස පිළිබඳ බලාපොරොත්තු වැඩි වේ.

1 ඈන් තනි කොළවල ඇගේ දින පොත නැවත ලිවීම අරඹයි.
2 ඈන් සමහර අවස්ථාවල කෙටි කතාද ලියන අතර ඒවා අනෙක් අයටද කියවයි.
3 පීටර් වැන් පෙල්ස්ට තමා ආදරය කරන බවක් ඈන්ට දැනේ.
4 ඈන් සහ පීටර්, පීටර්ගේ කාමරයෙහි පැය ගණන් එක්ව ගත කරති.




'මට ළඟ ළඟම එන හෙණ හඬී'

ඈන් ෆ්‍රෑන්ක්
'මෙවැනි කාල ඉතා අපහසුය. පරමාදර්ශ, සිහින, වටිනා බලාපොරොත්තු අප තුළ ගොඩ නැගේ. එහෙත් එය කටුක යථාර්ථය මගින් සුනු විසුනු වනු ඇත. මගේ සියලු පරමාදර්ශ මා අත්හැර දමා නොතිබීම පුදුමයකි. ඒවා විකාර වුද ප්‍රායෝගික නොවූද ඒවාය. එහෙත් මම තවමත් ඒවාට ඇලී සිටින්නේ කුමක් සිදු වුවද මිනිසුන්ට ඇත්තෙන්ම හොඳ හදවතක් ඇතැයි විශ්වාස කරන නිසාය. අවුල්, වේදනා සහ මරණය යන පදනම මත මගේ ජීවිතය ගොඩ නැගීමට මට කොහෙත්ම නොහැක. මට ලෝකය සෙමින් සෙමින් වියරු බවට පත්වෙනු පෙනේ. මට ළඟ ළඟම හෙණ හඬ ඇසේ. එයින් අපද දවසක විනාශ වනු ඇත. දහස් ගණනකගේ වේදනා මට දැනේ. එහෙත් මම අහස දෙස බලන විට සෑම දෙයක්ම හොඳ අතට වෙනස් වනු ඇතැයි සිතේ. මේ කෲරත්වය අවසන් වී සාමය සහ සැනසිල්ල නැවත එනු ඇතැයි සිතේ. මේ අතරවාරයේදී මම මගේ පරමාදර්ශයන්ට ඇලී සිටිය යුතුය. සමහර විට මට ඒවා යථාර්ථයක් කර ගත හැකි දිනය උදා වනු ඇත.'

1944 අගෝස්තු 1 වන දින ඈන් දිනපොතේ අවසන් සටහන තබයි. දින තුනකට පසු, 1944 අගෝස්තු 4වන දින රහස් ඇනෙක්සියෙ සියලු දෙනා භීතියෙන් සිටි මොහොත උදා වෙයි.

1 ඈන් බොහෝ විට තම හැඟීම්වලට පුරුදු වීමටත් අවට ලෝකයේ සිදුවන දේවලට හුරු වීමටත් දඟලමින් අට්ටාලයේ කාලය ගත කරයි.




පාවා දීම

1944 අගෝස්තු 4වන දින ප්රින්සන්ගාට් ගොඩනැගිල්ල ඉදිරිපිට මෝටර් රථයක් නවත්වයි. අවි ගත් පුරුෂයන් කණ්ඩායමක් ගුදමට ඇතුළු වෙති. මෙහි යුදෙව්වන් සිටින බව යමකු පොලිසියට කියා ඇත. කාල් ජෝසෆ් සිල්බර්, ඔස්ට්‍රියානු නාසියකු එම කණ්ඩායමේ නායකයා වෙයි. අනෙක් අය ලංදේසි පොලිස් නිලධාරීහු වෙති. රහස් ඇනෙක්සියෙ පදිංචිකරුවෝ මහත් පුදුමයට පත් වෙති. ඔවුන්ට යන්තම් බෑග් අහුරා ගැනීමට පමණක් කාලය ලබා දෙනු ලැබේ. සිල්බර්බව්වා ලිපි දමන පෙට්ටියක් (brief case) උදුරාගෙන එහි ඇතුළත ඇති දේ සොලවා ඉවත් කරන්නේ, මුදල් ස්වර්ණාභරණ තිබේ නම්, ඒවා රැගෙන යාමට එය පාවිච්චි කිරීමටය. ඈන්ගේ දිනපොතේ කොළ බිම වැටේ. පසුව ඈන් සහ අනෙක් අය ප්‍රාදේශීය බන්ධනාගාරයට ගෙන යනු ලැබේ. පැය කිහිපයකට පසු මීප් ගයිස් සහ බෙප් වොස්කුල් රහස් ඇනෙක්සියට පැමිණේ. එහිදී ඔවුන්ට ඈන්ගේ දිනපොත් හමු වෙයි. ඔවුන් ඒවා රැගෙන යති. මීප් එය තමාගේ මේස ලාච්චුවට දමා අගුළු දමයි.'

1 කාල් ජෝසෆ් සිල්බර් බව්වා, අත්අඩංගුවට ගැනීම මෙහෙයවූ එස් එස් නිලධාරියා. වර්ෂ දහ නවයකට පසු 1963 දී ඔහුව වියනා නගරයේ පොලිස් නිලධාරියකු වශයෙන් සේවය කරමින් සිටියදී අත් අඩංගුවට ගනු ලැබේ. ඔහුව අත් අඩංගුවට ගන්නා අතර පසුව ප්‍රකාශයක් කරයි. ඔහුට දැනුම් දුන්නේ කවුද යන්න නොදන්නා බව ඔහු කියයි. රහස් ඇනෙක්සියෙ වැසියන්ව පාවා දුන්නේ කවුද යන්න අද දක්වාම පැහැදිලි නැත.

2 ඈන් ඇතුළු පිරිස මුලින්ම ගෙස්ටපෝ මූලස්ථානයට ගෙන එනු ලැබේ. දින හතරකට පසු ඔවුන්ව ඩ්‍රෙන්ත් පළාතේ වෙස්ටර්බ්‍රූක් අතරමැදි කඳවුරට දුම්රියෙන් ගෙන යනු ලැබේ.




## 'සිදු වන්නේ කුමක්දැයි අපි දැන සිටියෙමු'

ඔටෝ ෆ්‍රැන්ක්
'අප නැවතත් එකතු වුනෙමු. ගමනේදී අපට ලැබුනේ ආහාර ස්වල්ප ප්‍රමාණයක් පමණි. වෙස්ටර්බුක් ගමනාන්තය දක්වා අප ජීවත්ව නොසිටිනු ඇතැයි අපි යටි සිතින් බලාපොරොත්තු වුනෙමු. අවසානයේදී පෝලන්තයට පිටුවහල් කිරීම ගැනද අපි දැන සිටියෙමු. ඕස්විච්, ට්‍රබ්ලින්කා සහ මේඩනක්හි සිදු වෙමින් තිබූ දේද අපි දැන සිටියමු. එහෙත් පෝලන්තයේ බොහෝ දුරට රුසියානු හමුදා ගොස් නොතිබුණේද? වාසනාව පිළිබඳ ස්වල්ප මාත්‍ර බලාපොරොත්තුවක් තැබිය හැකි තරමට යුද්ධය දුර දිග ගොස් තිබුණි. වෙස්ටර්බුඳ් වෙත ගෙන යන අතර අපට වාසනාව උදා වනු ඇතැයි අපි බලාපොරොත්තු වුනෙමු.'

වෙස්ටර්බුක්හි මිනිසුන් දහස් ගණන් රඳවා තිබුණි. රහස් ඇනෙක්ෂියේ වැසියන් ස්වේඡාවෙන්ම නෙරපා හරිනු ලැබීම සඳහා නොපැමිණි හෙයින් ඔවුන්ව විශේෂ දඬුවම් ඒකකවලට දමන ලදි. ඔවුන්ට රැකවලුන් විසින් විශේෂයෙන් දැඩි දඬුවම් පමුණුවන අතර ඉතා බර වැඩ කිරීමට බල කරනු ලැබේ. යුදෙව්වන් අහුරන ලද දුම්රිය නිතිපතා නැගෙනහිර දෙසට පිටත් වේ. සති හතරකට පසු ඈන් ඇතුළු රහස් ඇනෙක්සියෙ වැසියන් වෙස්ටර්බුක්හි සිට යන අවසාන දුම්රියෙන් අවුට්ස්විච් වෙත ගෙන යනු ලැබේ.

1 නෙදර්ලන්තයේදී අල්ලා ගනු ලබන සෑම යුදෙව්වකුම පාහේ මුලින්ම වෙස්ටර්බුක් අතරමැදි කඳවුරට යවනු ලැබේ.
